**ශ්‍රී ලංකා රග්බි ආයතනය - 2023**

**----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය ව්‍යාවනය**

ශ්‍රී ලංකා රග්බි ආයතනයේ ("ශ්‍රී ලංකා රග්බි ආයතනය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත්, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සහ 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධිත) පනතේ 21(අ) වගන්තිය ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ශ්‍රී ලංකා රග්බි ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2 මතය ව්‍යාවනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව ශ්‍රී ලංකා රග්බි ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

**1.1. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන වන සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ශ්‍රී ලංකා රග්බි ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සම්මේලනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ශ්‍රී ලංකා රග්බි ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා රග්බි ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.2. විගණන විෂය පථය

මාගේ වගකීම වන්නේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනයක් සිදුකර වාර්තාවක් නිකුත් කිරීමයි. කෙසේවෙතත්, මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ඉදිරිපත් කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රග්බි ක්‍රීඩාවේ මුළු ජංගම වගකීම් එහි මුළු ජංගම වත්කම් රු. 39,209,383 කින් ඉක්මවා ගොස් ඇති අතර, සමාලෝචිත වර්ෂය අවසානයේදී මුළු වගකීම් එහි මුළු වත්කම් රු. 40,365,299 කින් ඉක්මවා ගොස් ඇත. තවද සමුච්චිත අරමුදලේ සෘණ ශේෂය, 2023 දෙසැම්බර් 31 වන විට එහි මුළු වත්කම් රු. 25,030,520 කින් ඉක්මවා ඇති බව විගණනය තුලින් අනාවරණය වූ අතර එමඟින් ශ්‍රී ලංකා රග්බි ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පෙන්නුම් කර තිබුණි. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශන තුල මෙය අනාවරණය කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ශ්‍රී ලංකා රග්බි ආයතනය එහි අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳ මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කර සහතික කළ යුතුය. |

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SMEs සඳහා SLFRS) 17 කොටසේ 17.31 ඡේදය අනුව ඵලදායි ජීව කාලය හෝ ක්ෂය කළ හැකි වත්කම ක්ෂය වීමේ අනුපාතය හෙළිදරව් කළ යුතුය. කෙසේ වෙතත්, ගෘහ භාණ්ඩ සහ උපාංග සඳහා ඵලදායි ජීව කාලය හෝ ක්ෂයවීම් අනුපාතය මූල්‍ය ප්‍රකාශන තුල අනාවරණය කර නොතිබුණි. තවද, මූල්‍ය ප්‍රකාශන තුල දක්වා ඇති ක්‍රීඩා උපකරණ සඳහා ක්ෂයවීම් වටිනාකම සහ විගණනය සඳහා ලබා දී ඇති ගණනය කරන ලද සටහන් අතර රු.11,622 ක වෙනසක් නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත. | ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂයේදී නීති ගාස්තු ලෙස රු.330,000ක් දරා ඇති අතර, වාර්තා කරන දිනයේදී පැවති නීතිමය කටයුතු සහ බැඳීම් පිළිබඳ විස්තර සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 21 වැනි වගන්තියට අනුව අසම්භාව්‍යයන් යටතේ අනාවරණය කර නොතිබුණි. | -එම- | -එම- |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු. මිලියන 5ක දිගුකාලීන ණය මුදල 2017 දෙසැම්බර් 07 වැනි දින පෞද්ගලික වාණිජ බැංකුවකින් ලබාගෙන තිබුණු අතර එය වසර 03ක් ඇතුළත පියවීමේ කොන්දේසියක් මත ලබා ගෙන තිබුණි. කෙසේ වෙතත්, 2020 මැයි මාසයේ සිට මෙම ණය ආපසු ගෙවීම පැහැර හැර ඇත. ඒ අනුව 2020 මැයි මස අග වන විට පැවති හිඟ ණය ශේෂය රු. 1,362,221, වාර්ෂිකව සියයට 03 ක සාමාන්‍ය පොලියක් සහ සියයට 04 ක දඩ පොලියක් සමඟ පියවිය යුතු විය. එසේ වුවද, ශ්‍රී ලංකා රග්බි ආයතනය විසින් 2023 දෙසැම්බර් 31 දිනට සැබෑ වගකීම හඳුනා ගැනීම වෙනුවට මූල්‍ය ප්‍රකාශන තුළ වගකීමක් ලෙස 2020 මැයි 31 වන විට පැවති රු. 1,362,221 ශේෂය පෙන්වා තිබුණි. | අදහස් දක්වා නොමැත. | මූල්‍ය ප්‍රකාශන තුළ සත්‍ය වගකීම හඳුනාගත යුතුය. |

### 1.5.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සෑම ගෙවීම් වවුචරයක්ම අනුමත කරනු ලබන නිලධාරියා සහ සහතික කිරීමේ නිලධාරියා විසින් අත්සන් කළ යුතුය. කෙසේ වෙතත්, රු.17,008,285 ක් වූ ගෙවීම් වවුචර 142 ක් බලයලත් නිලධාරීන් විසින් අනුමත කර සහතික කර නොතිබුණි. එබැවින් මෙම ගෙවීම්වල නිරවද්‍යතාවය විගණනයේ දී තහවුරු කර ගත නොහැකි විය. | අදහස් දක්වා නොමැත. | සෑම ගෙවීම් වවුචරයක්ම අනුමත කරනු ලබන නිලධාරියා සහ සහතික කිරීමේ නිලධාරියා විසින් අත්සන් කර ඇති බව සහතික කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| අයිතමය | මුදල රු. මිලියන | ලබාදී නොමැති සාක්ෂිය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) නීති ගාස්තු | 7,412,949 | බිල්පත්, ඉන්වොයිසි සහ පිළිගැනීම් ආදිය. | අදහස් දක්වා නොමැත. | විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු සම්පාදනය කළ යුතුය. |
| (ආ) අත්තිකාරම් | 2,812,450 | ගෙවීම් වවුචර, ආධාරක ලියකියවිලි සහ අත්තිකාරම් ලේඛනය. | -එම- | |
| (ඇ) ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය. | - | විධායක කමිටුවේ රැස්වීම් වාර්තා සහ එහි ප්‍රගතිය. | -එම- | |

## 1.6. ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලැබිය යුතු රු. 1,882,343 ක වටිනාකම වර්ෂ 01-02 අතර කාලය තුළ අයකර නොගෙන හිඟව පැවතුනි. 2023 දෙසැම්බර් 31 දිනට පළාත් සංගම් 02 ක් සඳහා ලබා දී ඇති අත්තිකාරම් මුදල් රු. 1,249,442 ක් වසර 05කට වැඩි කාලයක් නිරවුල් කර නොතිබූ අතර මෙම ශේෂයන් අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ලැබිය යුතු මුදල් සහ කල් ඉකුත් වූ අත්තිකාරම් ආපසු අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2023 දෙසැම්බර් 31 දිනට පැවති රු. 2,129,100 ක් සහ රු. 32, 959,023 ක් වූ ණයහිමි ශේෂයන් පියවීමකින් තොරව පිළිවෙලින් වසර 01-02 ක් සහ වසර 03 කට වැඩි කාලයක් පැවතුනි. | අදහස් දක්වා නොමැත. | ණයහිමි ශේෂ පියවීම සඳහා, පවතින බැඳීම් පිළිබඳ විමර්ශනය කර ඒ අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) රු. 53,000ක් වූ සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතු වටිනාකම සහ රු. 1,000,000ක් වූ සේවක වන්දි පිළිවෙලින් 2020 සහ 2021 වර්ෂයේ සිට පියවීමකින් තොරව පැවතුනි. | අදහස් දක්වා නොමැත. | සේවක භාරකාර අරමුදල නියමිත දිනට ගෙවීමට කටයුතු කළ යුතු අතර ගෙවිය යුතු සේවක වන්දි ගෙවීම් කිරීමටද කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) සංවිධානය තුළ පැවති මූල්‍ය සීමාවන් හේතුවෙන් එවකට ශ්‍රී ලංකා රග්බි ආයතනයේ සභාපතිවරයාගෙන් ලබාගත් රු. 6,700,000 ක මුදලක් වාර්තාව නිකුත් කරන දිනය දක්වාවත් ඔහු වෙත ආපසු ගෙවා නොතිබුණි. | -එම- | ගෙවිය යුතු මුදල් පියවීමට කඩිනම් පියවර ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදිය වෙත යොමු කිරීම | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2016 ඔක්තෝබර් 27 දිනැති අංක 1990/23 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2016 අංක 01 දරණ ජාතික ක්‍රීඩා සංගම් නියෝග | | | |
| (i) III කොටසේ (xi) කොටස | වත්මන් ජාත්‍යාන්තර ශ්‍රේණිගත කිරීම්, කාල සීමාව තුළ අපේක්ෂිත ඉලක්ක සහ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා වූ උපාය මාර්ග ඇතුළුව වසර 10ක කාලයක් සඳහා සංයුක්ත සැලැස්ම සකස් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා වූ ඉලක්ක සහ උපාය මාර්ග ඇතුළත්ව වසර 10 ක කාලයක් සඳහා සංයුක්ත සැලැස්ම සකස් කළ යුතුය. |
| (ii) III කොටසේ (xii) කොටස | ඉදිරි වසර සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු අතර ක්‍රියාකාරී සැලැස්ම පවත්නා වර්ෂය අවසානයේ සිට මාස 03කට පෙර ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු බව දක්වා තිබුණද එසේ සිදු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ඉදිරි වසර සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) III කොටසේ (xv) කොටස | විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහිත වාර්ෂික වාර්තාව වාර්ෂික මහා සභා රැස්වීමේදී හෝ විශේෂ මහා සභා රැස්වීමේදී සභාගත කළ යුතු වුවද ශ්‍රී ලංකා රග්බි ආයතනය විසින් 2021 සහ 2022 වර්ෂ සඳහා වාර්ෂික වාර්ථා සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | 2021 සහ 2022 වර්ෂ සඳහා වාර්ෂික වාර්ථා වාර්ෂික මහා සභා රැස්වීමේදී හෝ විශේෂ මහා සභා රැස්වීමේදී සභාගත කිරිමට කටයුතු කල යුතුයි. |
| (ආ) ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද 2022 දෙසැම්බර් 17 දිනැති අංක DSD/NSA/COM 01/2021 දරණ ජාතික ක්‍රීඩා සංගම් පිළිබඳ මාර්ගෝපදේශ | | | |
| i. මාර්ගෝපදේශය 3(iii) | උපරිම වශයෙන් බැංකු ගිණුම් 02ක් පමණක් පවත්වාගෙන යා හැකි අතර බැංකු ගිණුම් 02කට වඩා පවත්වාගෙන යාමට අවශ්‍ය නම් ඒ පිළිබඳව ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය. කෙසේ වෙතත්, ඊට පටහැනිව ශ්‍රී ලංකා රග්බි ආයතනය විසින් ජංගම ගිණුම් 04ක් පවත්වාගෙන ගොස් තිබුණි. | අදහස් දක්වා නොමැත. | අවශ්‍ය අනුමැතියන් ලබාගැනීමට කටයුතු කළ යුතුයි. |
| ii. මාර්ගෝපදේශය 3(xiv) | සෑම වර්ෂයකම අවසානයේ දී ස්ථාවර වත්කම් සහ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ පිළිබඳ සමීක්ෂණක් සිදු කර අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුල පෙන්වා ඇති රු. 3,707,087 ක් වටිනා ස්ථාවර වත්කම් පිළිබඳ සහ රු. 700,981ක් වූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ පිළිබඳ භාණ්ඩ සමීක්ෂණක් සිදු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීමට කටයුතු සම්පාදනය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 4,456,249 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 3,810,997 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 645,252 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පෙර වසරට සාපේක්ෂව මුළු ආදායම රු. 56,846,733කින් අඩු වීමට එරෙහිව මුළු වියදම් රු. 47,370,972 කින් අඩුවීම මෙම පිරිහීම සඳහා ප්‍රධාන ලෙස බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව 2021 සහ 2022 වර්ෂයන්හි නිකුත් කරන ලද රු. 817,926 කු වූ චෙක්පත් 15ක්, 2024 සැප්තැම්බර් 30 වන විටත් ඉදිරිපත් වී නොතිබුණි. කෙසේ වෙතත්, ඒවා ආයතනයේ ආදායම ලෙස හඳුනා ගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මාස 6කට වඩා වැඩි ඉදිරිපත් නොවූ චෙක්පත් ආදායම් ලෙස හඳුනාගත යුතුය. |

### 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 මාර්තු 10 දිනැති අංක 2166/9 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ 11 වැනි වගන්තියේ විධිවිධානවලට පටහැනිව අවස්ථා 04කදී රු 1,026,340ක් වටිනා භාණ්ඩ මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය කර තිබුණි. | අදහස් දක්වා නොමැත. | භාණ්ඩ, කාර්යයන් සහ සේවා ප්‍රසම්පාදනය සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය. |

**4. වගවීම සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 ඔක්තෝබර් 27 දිනැති අංක 1990/23 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශයට පත් කරන ලද 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග වල III කොටසේ (xiii) වගන්තිය අනුව කමිටුව විසින් සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශන 2024 පෙබරවාරි 28 ට පෙර එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ සිට මාස 02 ක් ඇතුළත විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2023 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශයන දළ වශයෙන් මාස 06ක පමණ ප්‍රමාදකින් පසු විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණේ 2024 අගෝස්තු 28 දිනය. | අදහස් දක්වා නොමැත. | සෑම මුදල් වර්ෂයක් අවසන් වී සිට මාස 02ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. |